**හම්බන්තොට ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1(අ) ඡේදයේ නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයන්ට අදාළව ලැබිය යුතු රු. 6,579,300 ක මුද්දර ගාස්තු ආදායම 2019 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම සමාලෝචිත වර්ෂයේදීත් නිවැරදි කර නොතිබුණි | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු රු.464,900 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම රු. 464,900 ක් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා කසළ ගාස්තු ආදායම් බිල්කිරීම රු. 51,500 ක් අඩුවෙන් හා වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම බිල් කිරීම රු.1,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සභාවේ ආදායම් රු.50,500 ක් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ කර්මාන්ත 06 ක එකතු වටිනාකම වූ රු. 2,610,004 ක් සඳහා ණයගිම් ප්‍රතිපාදන වෙන්කර තිබීමෙන් ණයගිම් ප්‍රතිපාදන එම ප්‍රමාණයෙන් අධි වෙන් කිරීමක් සිදුකර තිබුණි. | 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් වැඩ ආරම්භ කිරීමට නොහැකි වූ බවත්, 2021 වර්ෂයේදී එම කර්මාන්ත 06 න් 05 ක් ඉටු කළ බව. | ගිවිසුම්ගත වූ බැඳීම් සඳහා පමණක් ණයගිම් ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියෙක් සඳහා රු.65,074 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීමෙන් ණයහිමි ශේෂය එම අගයෙන් අඩුවෙන් දැක්වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ණයහිමි ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.217,294 ක් වටිනා යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි . | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළ සභාවේ පෙරටුකාර්යාලය නවීකරණය කිරීමේ ප්‍රාග්ධන වියදම රු.71,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි . | - එම - | - එම - |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති රු. 146,250 ක් වූ විදුලි ෆ්ලැෂර් ලයිට් තොගය පරිභෝජන ද්‍රව්‍ය ලෙස ගිණුම්ගත නොකර උපකරණ හා මෙවලම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | ප්‍රාදේශීය සභාව සතු ගොඩනැගිලි 10 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි අදාළ ආයතන වලින් පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කරමි. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.30,923,086 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාල උපලේඛන/උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.12,855,089 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එකතුව රු. 154,643,551 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ හඳුනා ගෙන ඉදිරියේදී විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,698,785 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමරු. 33,342,475 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | ලැබිය යුතු වරිපනම් බදු රු. 814,306 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදීත් 2011 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අයකර තිබීමෙන් තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වර්ෂ 05 ක් වූ අතර සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව සහ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළද මෙතෙක් තක්සේරුව සිදුකර නොමැති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමත් වරිපනම් දේපල කාලීනව තක්සේරුකළ යුතුය. |
| ii. | ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු.21,450 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසා ඇති ව්‍යාපාර වලින් අයවිය යුතු හිඟ මුදල් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| **(ආ)** | **වෙළඳ බලපත්‍ර ගාස්තු** | | |
| i. | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.725,630 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.710,880 ක් කපා හැරීමට ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කළෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු.302,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් සඳහා නඩු පැවරුවෙමි. | -එම- |
| **(ඇ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 4,855,135 ක් සහ රු. 25,245,653 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු කඩ කාමර සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ 2018 ජනවාරි 26 දිනැති තක්සේරු වාර්තාව අනුව මාසික කඩ කුලිය ආරම්භයේ පවතින කඩ කාමර 06 න් රු. 1,350 ක්ද අවසාන කඩ කාමර 06 න් රු. 2,000 ක් ද අය කළ යුතු වුවත් 2018 මැයි 18 දිනැති සභා තීරණයට අනුව එම කඩ කාමර සඳහා පිළිවෙලින් රු. 450 ක් හා රු. 500 ක් බැගින් අය කර තිබීමෙන් 2018 වර්ෂයේ ජූලි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සභාවට අහිමි වූ ආදායමරු. 432,000 ක් විය. | කඩ කාමර ඉදි කළ ප්‍රදේශය නොදියුණු ගම්මානයක් ලෙස පවතින බැවින් තක්සේරු වාර්තාවට අනුව කුලී අය නොකර සභා තීරණය පරිදි කුලී අයකළෙමි. | තක්සේරු දෙපාර්තමේන් තුවෙන් ලද තක්සේරුව ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දී සභා අරමුදලින් රු. 848,362 ක් වැය කර මයුරපුර සති පොළ භූමියේ ඉදිකර තිබුණු ආපන ශාලා ගොඩනැගිල්ල ඵලදායි ලෙස භාවිතයට ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ආපනශාලා ලබාදීමට පුද්ගලයන් හඳුනාගෙන තිබුණද එම ස්ථානවල ව්‍යාපාර කටයුතු සිදු කිරීමට එකඟතාවය ඵලකර නොමැති බව. | වත්කම් ඵලදායි ලෙස යොදාගත යුතුය. |